පිළියන්දල අධ්‍යාපන කලාපය
**Piliyandala Education Zone**

| 14 | I, II, |
|---|---|

6 ශ්‍රේණිය - දෙවන වාර පරීක්ෂණය 2017 ජුලි **Second Term Test 2017 - Grade 6**

**කතෝලික ධර්මය**

කාලය පැය 2
Two Hours

උපදෙස් : සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

## 1 කොටස

01) දොළොස් වියැති ජේසු කුමරු ජෙරුසලමට ගියේ කුමන මංගල්‍යය සැමරීමට ද?
i) පෙන්තකොස්ත මංගල්‍ය සැමරීමට
ii) පාස්කු මංගල්‍ය සැමරීමට
iii) කූඩාරම් මංගල්‍ය සැමරීමට
iv) කානික්ක මංගල්‍ය සැමරීමට

02) ප්‍රසාද ස්නාපනය ලැබීමෙන්,
i) පරිණත කිතුනුවකු වේ.
ii) කිතුණු භටයකු බවට පත්වේ.
iii) ක්‍රිස්තුන් වහන්සේ පූපාකාරයෙන් වැඩම කරයි.
iv) දේව දරුවකු බවට පත්වේ.

03) බිඳුනු දෙවි මිනිස් සබඳතාව යළි ඇතිකරනා ප්‍රසාද නිධානය කුමක් ද?
i) ප්‍රසාද ස්නාපනය
ii) දිව්‍ය සත්ප්‍රසාදය
iii) සමඟි සන්ධානය
iv) අභිවෘද්ධි ආලේපය

04) කිතුනුවා තුළ නොමැකෙන ලාංඡනයක් තබන ප්‍රසාද නිධානය වන්නේ,
i) සමඟි සන්ධානය
ii) දිව්‍ය සත්ප්‍රසාදය
iii) රෝගීන්ගේ ආලේපය
iv) අභිවෘද්ධි ආලේපය

05) නෙබුදඩ්කර් නම් රජුගේ රන්රූපයට නොවැදීම නිසා ගිනි උදුනට දැමූ ජුදෙව් ජාතිකයන් තිදෙනා,
i) ෂද්‍රක්, ජුදා, අබෙද්නෙගෝ
ii) සිමියොන්, ෂද්‍රක්, මේෂක්
iii) ෂද්‍රක්, මේෂන්, අබෙද්නෙගෝ
iv) රූබන්, ෂද්‍රක්, මේෂක්

06) දේව නාමයට ගරුකළ යුතු බව අපට මතක්කර දෙන දේව පණත වන්නේ,
i) 1 වන පණත
ii) 2 වන පණත
iii) 3 වන පණත
iv) 4 වන පණත

07) අන් අයට අයිති දේ රහසින් ලඟ තබා ගැනීම කී වන පණතට විරුද්ධව කරන පාපයක් වන්නේ ද?
i) 6 වන පණත ය.
ii) 3 වන පණත ය.
iii) 5 වන පණත ය.
iv) 7 වන පණත ය.

08) ''මා හැර අන් කිසිම දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතුය'' මෙම කියමන අදාළ වන පණත වන්නේ,
i) 3 වන පණත ය.
ii) 6 වන පණත ය.
iii) 1 වන පණත ය.
iv) 8 වන පණත ය.

09) ජේසු තුමාගේ උපත දේවදූතයන් විසින් ප්‍රථමයෙන් දැනුම් දුන්නේ කාහ ට ද?

i) රජවරුන්ට ii) නායක පූජකයන්ට

iii) එඬේරුන්ට iv) නෑදැයන්ට

10) ජේසු තුමන් බැහැදැකීමට පැමිණි ශාස්ත්‍රවන්තයෝ ජේසු බිළිඳාණන්ට ලබා දුන් තුටු පඬුරු වන්න්,

i) රන්, තුවරලා, ධවල වස්ත්‍ර ii) ධවල වසුත්‍ර, ගන්ධරස, රන්

iii) රන්, තුවරලා, ගන්ධරය iv) ගන්ධරස, ධවලවස්ත්‍ර, තුවරලා

11) "ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරයයි. මා සිහි කිරීම පිණිස මෙය සිදු කරන්න" මෙම වදන් ප්‍රථම වරට ප්‍රකාශ කලේ කවදා ද?

i) මහ සිකුරාදා ii) දිව්‍ය පූජා වෙදී

iii) අළු බදාදා iv) මහ බ්‍රහස්පතින්දා

12) නිල්මිණී ඉරුදින දිව්‍ය පූජාවට සහභාගී නොවී දේවාලයකට ගොස් යහළුවන් සමඟ පලතුරු වට්ටියක් පූජා කළාය. ඇය කඩ කළ පහන් 2 වන්නේ

i) 2 හා 3 පණත් ය ii) 1 හා 3 පණත් ය

iii) 1 හා 2 පණත් ය iv) 1 හා 5 පණත් ය

13) ශ්‍රී ලංකාවේ කතෝලිකයන්ට නියම වන ණය මංගල්‍ය දිනයක් වන්නේ,

i) මැයි 31 ii) දෙසැම්බර් 8 iii) ජනවාරි 13 iv) අගෝස්තු 8

14) අපට දුක් පීඩා පැමිනෙන විට අප කල යුත්තේ,

i) දෙවිඳුන්ට වඩා අන් අයගේ පිහිට පැතිය යුතුයි

ii) ඒවාට විසඳුම් සොයමින් යාච්ඤා කළ යුතුය

iii) එවාට විසදුම් සොයා ගත යුතුය. iv) තව කෙනෙක්ට පැවසිය යුතුය.

15) කෙනෙක් අපට හිරිහැර කල විට,

i) ඔහුට දඬුවම් දිය යුතුය. ii) නැවත කතා බහ නොකළ යුතුය.

iii) ඔහුගෙන් ඈත්විය යුතුය. iv) ඔහු වෙනුවෙන් දෙවිඳුන් අයදිය යුතුය.

A උත්පත්ති පොත

B ගණන් කතාව

C එළිදරව්ව

D හිතෝපදේශය

16) ශුද්ධ බයිබලයේ මුල් පොත හා අවසාන පොත වන්නේ,

i) A සහ C ii) A සහ D iii) A සහ B iv) C සහ B

17) හිසට දෑත් තබා යාච්ඤා කරන්නේ කුමන දේව ප්‍රසාද නිධානය ලබාදීමේදී ද?

i) ප්‍රසාද ස්නාපනය ii) දිව්‍ය සත්ප්‍රසාදය

iii) රෝගීන්ගේ ආලේපය iv) පූජාත්වරය

18) A ප්‍රසාද ස්නාපනය

B පූජාත්වරය

C රෝගීන්ගේ ආලේපය

D සමගිවීමේ ප්‍රසාද නිධානය

ඉහත ප්‍රසාද නිධානවලින් එක් වරක් පමණක් ලබාගත හැකි ප්‍රසාද නිධාන වන්නේ,

i) A සහ B ii) A සහ D iii) C සහ B iv) A සහ B

19) ගිහියන් විසින් දානය කරගනු ලබන ප්‍රසාද නිධානය වන්නේ,

i) ආශිර්වාද කාර බන්ධනය ii) පූජාත්වරය

iii) රෝගීන්ගේ ආලේපය. iv) දිව්‍ය සත්ප්‍රසාදය

20) "ඔබ යමෙකුගේ පව් කමා කරන්නහුද ඒවා ඔවුන්ට කමා කරනු ලැබේ" මෙම බයිබල් පාඨය සම්බන්ධ ප්‍රසාද නිධානය කුමක් ද?

i) අභිවෘද්ධි ආලේපය ii) ආශිර්වාදකාර බන්ධනය

iii) දිව්‍ය සත්ප්‍රසාදය iv) සමගි වීමේ ප්‍රසාද නිධානය

(ල 2x20=40)

## 11 කොටස

*** පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

*** පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.**

01. i) පැරණි ගිවිසුමට අයත් පොත් 3ක් ලියන්න. (ල 3)

ii) නික්මයාම පොතේ තිබෙන නායකත්ව චරිතය කුමක්ද? (ල 2)

iii) ජාකොබ් සහ ජුවාම් තුමාගේ පියා සහ මවගේ නම් සඳහන් කරන්න. (ල 2)

iv) දේව මැවිල්ල ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි ක්‍රියා 3ක් ලියන්න (ල 3)

v) දේව මැවිල්ලෙන් ඔබට ඇති ප්‍රයෝජන 3ක් නම් කරන්න. (ල 3)

vi) දෙවිපියා දුන් මේ ලස්සන මැවිල්ල වෙනුවෙන් ස්තුති කර යාච්ඤාවක් ලියන්න. (ල 3)

02. i) දේව ප්‍රසාධ නිධානයක ප්‍රධාන ලක්ෂණ 2ක් සඳහන් කරන්න (ල 2)

ii) විවිධ ජීවිත අවධි 3ක් නම් කර එම අවධි වලදී ලබාගන්නා ප්‍රසාධ නිධාන 3ක් ලියන්න. (ල 3)

iii) ප්‍රසාධ ස්නාපනය නමැති දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමෙන් ඔබට ලැබෙන වරප්‍රසාද 6ක් ලියන්න. (ල 6)

03. i) දේව ප්‍රසාද නිධානයක් යනු කුමක්ද? (ල 2)

ii) මෙතෙක් ලබා නොමැති ඉදිරියේදී ලබා ගත යුතු දේව ප්‍රසාද නිධාන 3ක් ලියන්න. (ල 3)

iii) ප්‍රසාද ස්නාපනයේදී භාවිතා කරන සංකේත ලියා ඒවායේ අදහස් ලියන්න. (ල 6)

04. i) සුවදානයේ දේව ප්‍රසාද නිධාන 2ක් ලියන්න. (ල 2)

ii) සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමේදී අනුගමනය කරන පියවර 3ක් ලියන්න. (ල 3)

iii) රෝගීන්ගේ ආලේපය ලැබිය යුතු අවස්ථා 3ක් ලියන්න. (ල 6)

05. i) සේවය සඳහා ස්ථාපිත ප්‍රසාද නිධාන 2ක් ලියන්න. (ල 2)

ii) ශුද්ධවු පවුලෙන් ඔබේ පවුලට ගතහැකි ආදර්ශ 3ක් ලියන්න. (ල 6)

iii) උපදේශකයාගේ පොතට අනුව දෙමාපියන් වෙනුවෙන් දරුවන්ගේ යුතුකම් හා වගකීම් 5ක් ලියන්න. (ල 5)

06. i) අහස පොළව සිවුපාවන් ගස්කොළන් මවා
එතුමන්ගේ මහිමෙ නිසා මිනිසා මැවුවා
එතුමන් වදිමු - එතුමන් ගයමු
රස වදනින් එතුමන් හට අපි ගී ගයමු

මෙම ගීතිකාව ගයන්නේ දිව්‍ය පූජාවේ කුමන අවස්ථාවේදීද? (ල 2)

ii) ඉරුදින දිව්‍ය පූජාව පිළිබඳව සඳහන් වන පණත කුමක් ද? (ල 3)

iii) සබත් දවස අප ගත කළ යුතු ආකාරය වචන 75න් ලියන්න. (ල 6)

07. i) දසපණත බෙදෙන කොටස් 2 ලියා එක් කොටසකට එක් පනත බැගින් ලියන්න. (ල 2)

ii) සහෝදරයා සඳහා අපගේ යුතුකම් දක්වෙන පණත් 3ක් ලියන්න. (ල 3)

iii) ඔබට කෙනෙක් වරදක් කල විට ඔබට කල හැකි දේවල් 3ක් ලියන්න. (ල 6)